## රසායනික ද්‍රව්‍ය නිසා ඇතිවන අවධානම තක්සේරු කිරීමේදී

1. විෂ රසායනික ද්‍රව්‍ය හදුනා ගැනීම හා ලේඛනගත කිරීම
2. එම විෂ රසායනික ද්‍රව්‍ය නිසා සෞඛ්‍යයට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල හා එම ප්‍රතිපල වලින් මිදිය හැකි ආකාර
3. එවැනි අහිතකර ප්‍රතිඵල ඇතිවීමට රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය සිදුවිය යුතු ප්‍රමාණය
4. එක් එක් සේවකයාට ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළු, ආරක්ෂක ක්‍රම අධ්‍යනය කිරීම
5. මෙවැනි ගැටළු ඇතිවීම වැලැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග තීරණය කිරීම ඇතුලත් වේ

## අවධානම අවම කිරීමේදී නියම ආකාරයෙන් කළමනාකරනය කල ගබඩාවක් භාවිතා කිරීම වැදගත් වේ. මෙහිදී,

1. විවිධ ආකාරයේ රසායනික හා භෞතික ගුණ ඇති ද්‍රව්‍ය එකට/එකම ස්ථානයේ ගබඩා නොකිරීම. එනම් කුඩු / දියර වශයෙන් රසායනික වෙන් වෙන්ව ගබඩා කිරීම.
2. ඍජු හිරු එළිය හා තාපය ලැබෙන ස්ථානයක ගබඩා කිරීමෙන් වැලකීම
3. බහාලුම්වල පියන් සැමවිටම හොඳින් වසා තබන්න
4. ද්‍රවමය රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීමේදී ඉසිරීම් වැලැක්වීමට තවත් බහාලුමක් තුළ ගබඩා කරන්න
5. ඉසිරුමක් ඇති වූ විට ආරක්‍ෂාකාරීව වහා පිරිසිදු කරන්න
6. සැම විටම ගබඩාව තුළ ගිනි ගැනීමකදී හෝ වෙනත් ආපදාවක් ඇති වූ විට අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග දැක්වෙන පුවරු සවිකරන්න




## මීට අමතරව

1. නියමිත ප්‍රමිතීන් ඉක්මවා රසායනික ද්‍රව්‍ය අඩංගු නිෂ්පාදන අලෙවි නොකිරීම
2. විෂ රසායනික අඩංගු ද්‍රව්‍ය වෙනුවට වෙනත් ආදේශක අලෙවිය සිදුකිරීම
3. ආහාරපාන ගැනීමට හා නැවත නිවෙස් බලා යාමට පෙර හොඳින් පිරිසිදු වීම (එමගින් ආහාර මගින් අවශෝෂණය වීම හෝ නිවෙස්වලදී පවුලේ සාමාජිකයන්ට විෂ රසායනික ද්‍රව්‍ය ආග්‍රහණය/අධිශෝෂණය වීම වැලකීම සිදුවේ)
4. නිරතුරුවම සෞඛ්‍යය සම්බන්ධව සැලකිලිමත් වීමද වැදගත්ය.
5. වෙළඳ ආයතනයක නම් රසායනික ද්‍රව්‍ය ළමයින්ට අත නොගැටෙන සේ ගබඩා / ප්‍රදර්ශන රාක්කවල තැබීම සුදුසු වේ.

**රසායනික ද්‍රව්‍ය නිසා ඇති අවධානම තක්සේරු කිරීම මගින් හදිසි අවස්ථාවකදී ප්‍රතික්‍රියා කිරීමට ගතවන කාලය හා හානිය අවම කරගත හැකි ය.**

**ගබඩා කිරීම මෙන්ම ප්‍රවාහනය කිරීමද ආරක්ෂාකාරීව සිදුකල යුතුය**

**හැකි සෑම විටම ආරක්ෂාකාරී භාවිතයෙන් නිසා සෞඛ්‍ය ගැටලු, පාරිසරික ගැටලු ඇතිවීමෙන් වැලකිය හැක**

මූල්‍ය අනුග්‍රහය
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ
ජගත් පාරිසරික පහසුකම් සුළු මූල්‍යාධාර වැඩසටහන

# ඔබ ආයතනයේ භාවිතාවන රසායනික ද්‍රව්‍ය කළමනාකරණය



**සෑම විටම ආරක්ෂාකාරීව රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්න.**

පරිසර යුක්ති කේන්ද්‍රය
20/A, කුරුප්පු පාර, කොළඹ 08.
දුරකථන: ++94-11-2683282
email: info@ejustice.lk web: www.ejustice.lk

*SAICM NGO focal point of Sri Lanka*

## ඔබ ආයතනයේ භාවිතා වන රසායනික ද්‍රව්‍ය හා ඒවා ආරක්ෂාකාරීව භාවිතා කරන අයුරු

එදිනෙදා ජීවිතයේදී කටයුතු පහසු කර ගැනීම සඳහා විවිධ රසායනික ද්‍රව්‍යවලින් සමන්විත නිෂ්පාදනයන් භාවිතා කිරීමට අප පුරුදු වී ඇත. නමුත් බොහෝ විට මෙම රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන හෝ භාවිතා කරන සේවා ස්ථානවල සේවකයින් හෝ අලෙවි මධ්‍යස්ථානවල සේවය කරන පුද්ගලයින් හෝ මෙම රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය වීම නිසා ඇතිවිය හැකි කෙටිකාලීන හෝ දිගුකාලීන සෞඛ්‍ය ගැටළු පිළිබඳව දැනුවත් වී නොමැත.

එමෙන්ම මෙම නොදැනුවත් භාවය නිසාම මොවුන් විසින් විවිධ වූ රසායනික ද්‍රව්‍ය නිසි පිරියම් කිරීමකින් තොරවම පරිසරයට මුදා හැරීම සිදුකිරීම මගින් පරිසර පද්ධතියට මෙන්ම අවට සිටින ජනතාවටද ඇතිවිය හැකි අහිතකර බලපෑම් එමටය.

ඔබ සේවය කරන සේවා ස්ථානයේ, වෙළඳ ආයතනයේ යොදාගන්නා රසායනික ද්‍රව්‍ය නිසා මුහුණදිය හැකි ගැටලු අධ්‍යනය කර අවධානම තක්සේරු ගත කිරීම මගින් හදිසි අවස්ථාවකදී ප්‍රතික්‍රියා කිරීමට ගතවන කාලය මෙන්ම, හානියද අවම කරගත හැකි අතරම රසායනික ද්‍රව්‍ය නිසා ඇතිවිය හැකි අවධානමද අඩුකර ගත හැක.

## ඔබ සේවා ස්ථානයේ භාවිතා වන රසායනික සංයෝග ගැන තොරතුරු සොයා බැලීමට,

1. රසායනික ද්‍රව්‍ය අඩංගු බහාලුමේ ලේබලය කියවීමෙන්
2. මුද්‍රිත ආරක්ෂණ දත්ත පත්‍රිකාව කියවීමෙන්
3. විවිධ ආකාරයේ මුද්‍රිතයන්/පත්‍රිකා මගින් (විවිධ භාවිතයන් හා ප්‍රමාණාත්මක මිණුම් පිළිබඳ)

## මේවා මගින්

1. බහාලුමේ අහිතකර විෂ රසායනික සංයෝග/ද්‍රව්‍ය අඩංගු වේද?
2. එම රසායනික ද්‍රව්‍යයේ / සංයෝගයේ නම සහ එහි වෙළඳ නාමය
3. භාවිතා කිරීම මගින් ඇතිවිය හැකි අහිතකර බලපෑම්
4. එවැනි රසායනික ද්‍රව්‍ය පරික්ෂාකාරී ලෙස භාවිතා කරන්නේ කෙසේද යන්න දැනගත හැක

# ඔබ ආයතනයේ විවිධ භෞතික ස්වරූපයෙන් යුත් රසායනික ද්‍රව්‍ය භාවිතා වේ.

### ඝණමය

**අහිතකර බලපෑම් ඇතිවිය හැකි අයුරු**

- සමෙහි තැවරී අධිශෝෂණය වීම.
- ආහාර සමග අධිග්‍රහණය වීම.
- ගිනි ගැනීමකදී නිකුත්වන අහිතකර විෂ වායු ආඝ්‍රාහණය මගින් හෝ පිපිරීම් ඇතිවීමෙන්.

**ආරක්ෂාකාරී ක්‍රියා පටිපාටි**

- අත් වැසුම් හා වෙනත් ආරක්ෂාකාරී ආවරණ පැලදීම.
- අධික තාපයක් ලැබෙන ස්ථානවල ගබඩා නොකිරීම හා භාවිතා නොකිරීම.

### වාෂ්ප හා වායු වර්ග

**අහිතකර බලපෑම් ඇතිවිය හැකි අයුරු**

- ආඝ්‍රාණය වීම මගින්
- අධික උෂ්ණත්ව වලදී පිපිරීම් ඇතිවීම මගින්

**ආරක්ෂාකාරී ක්‍රියා පටිපාටි**

- මුඛ ආවරණ පැලදීම
- අධික තාපයක් ලැබෙන ස්ථානවල බහාලුම් විවෘත නොකිරීම

### අංශුමය

**අහිතකර බලපෑම් ඇතිවිය හැකි අයුරු**

- ආශ්වාසය මගින් පෙනහලු තුළට ඇතුලුවීම නිසා

**ආරක්ෂාකාරී ක්‍රියා පටිපාටි**

- මුඛ ආවරණ පැලදීම
- හැකිතාක් සේවා ස්ථානය තුළ නිපදවෙන දූහුවිල්ල අවම කිරීම

### ද්‍රවමය (අම්ල/ දියකාරක/ බෂ්ම)

**අහිතකර බලපෑම් ඇතිවිය හැකි අයුරු**

- වාෂ්පශීලී නම් ආඝ්‍රාණය මගින්
- සම මත තැවරීමෙන් අධිශෝෂණය වීම

**ආරක්ෂාකාරී ක්‍රියා පටිපාටි**

- වාෂ්පශීලී ද්‍රව භාවිතයේදී මුඛ ආවරණ පැලදීම
- සැම විටම අත් වැසුම් භාවිතා කිරීම

# නිවැරදි ආකාරයෙන් රසායනික ද්‍රව්‍ය කළමණාකරනය නොකිරීම නිසා

### කෙටි කාලීන සෞඛ්‍ය ගැටලු

1. වමනය
2. කැම අරුචිය
3. සිහිමඳ ගතිය/ක්ලාන්ත වීම
4. ඇසෙහි, නාසයේ, සමෙහි කැසීම් ඇතිවීම

### දිගු කාලීනව ඇතිවන සෞඛ්‍ය ගැටලු

5. ස්වසන පද්ධතිය ආශ්‍රිත රෝග-ඇදුම
6. ඇස් පෙනීම දුර්වල වීම
7. මතක ශක්තිය අඩුවීම
8. පිළිකා වැනි රෝග
9. වකුගඩු ආබාධ
10. සමෙහි ඇතිවන විකෘති තත්වයන්